# සුභාෂිතයෙන්.......

කුස ඔත සිය සොහොවුරු වුවද තම හට
හිත නැත යෙහෙ දුරු කල පොකුරඹ ලෙසට
තම ගත වා පිත් සෙම් කිපෙනු ය මරට
වනගත ඔසු වග හිත වෙය් සුව පතට

**ගැදි පැදිය:**
(එක) කුස ඔත
සිය සොහොවුරු වුව ද
තම හට හිත නැත
පොකුරඹ ලෙසට
දුරු කල යෙහෙ
තම ගත
වා පිත් සෙම්
මරට කිපෙනු ය
වනගත ඔසු වග
සුවපතට හිත වෙය්

**තේරුම:**

එකම අම්මා කෙනකුගේ බඩේ සිටි, තමන්ගේ සොහොවුරා උනත්, තමාට හිතවත් නොවෙත් නම් නෙලුම් කොලයේ රැඳුනු ජලය මෙන් දුරු කරලීම (යහපති) මැනවි. තමාගේ ඇගේ වා පිත් සෙම් යන මේ තුන් දෙස් (කෙනෙකුගේ) මරනය සඳහා කිපීම සිදුවේ. එවිට කැලෑවේ ඇති බොහෙත් ජාති ඒ කෙනාගේ සුවය සඳහා හිතකර වේ.

**පැහැදුම:**
කුස ඔත - එකම අම්මා කෙනෙකුගේ බඩෙන් උපන්නත්/ එක බඩවැල කඩාගෙන ආවත් යනුවෙන් සාමාන්‍ය වියහරේ ඇත්තේ මේ අදහසය්, තමහට හිත නැත - තාමාට අහිතවත් (සතුරු) නම්, - පොකුරඹ ලෙසට -පුශ්කර" යන සකු වචනය සංහලයට බිඳෙන්නේ -පොකුරු" යනුවෙනි. පුශ්කර යනු නෙලුම්ය. අපේ පැදි බසේ දී නෙලුම් ගස, නෙලුම් මල, නෙලුම් කොලය යන තේරුම් තුනම සඳහා -පොකුරු " යෙදී ඇත.
පොකුරු අඹ/අඹු, පොකුරු (අ) කුරු, පොකුරු දැලි , පොකුරු පත් යන විදියටත් මේ පදය යෙදී ඇත. පොකුරු අඹු/අඹ යනු නෙලුම් කොලයේ එකතු වු වතුරය්. වතුර එකතු වු විට නෙලුම් කොලයේ වාටියේ තැනක් පාත් වී ඒ වතුර හැලී යෑම සිදුවේ. දුරු කල යෙහෙ -'දුරු' යන්න අද වියහරේ ඇත්තේ දුර/දුරස් කියය්. කල යනු කල හොත් / කලොත් යන්නමය්.

"අස මගිය ගම්වැසි - මග 'රැඳුන' අද තෝ නසි
ගෙට 'ගිය' අඹුව නසි - අතුරුදහන් විය කියා මේ
ලෙසි"
යන මේ එලිය (එලිවැට) සහිත ගීයේ හෙවත් ගී කවියේ ඇති, (මග) රැඳුන, (ගෙට) ගිය යන නිපාත ක්‍රියාවල අදහස වන්නේ (මග) රැඳුන හොත් සහ (ගෙට) ගියහොත් යන්නය්. යෙහෙ යනු යෙහෙකි / යහපති / හොඳය යන අදහස දෙය්.

මිනිසුන් ලෙඩ වන්නේ වා(වාත) පිත් (පිත) සෙම් (ශ්ලේශ්ම) යන තුන් දෙස් කිපීමෙන් බව ආයුර්වේදයේ කියා ඇත. සතුන්ටත් මේ හේතු බලපාත් දැය් මම නොදනිමි. 'බරවා' හැදි ඇත්තේ බර වා (වාත) යන පද දෙක එකතුවීමෙන් යය් සිතමි. බටහිර වෙදකමට අනුව නම් එය පනුවකු නිසා හැදෙන ලෙඩකි.

වනගත ඔසු - කැලෑ බේත්, එද ගෙවතුවල ඔසු වග වගා කිරිම කෙරුනේ කලාතුරකිනි. මුලු කැලෑවට ඔසු උයනක් වීම එයට හේතුවය්.
සුවපතට හිත වෙය් - සුවපත් වීම සදහා හිතකරය. ලෙඩවීම යනු මරුට ලංවීම බව මෙහි කියය්. බෙහෙතින් කරන්නේ මරු දුරු කිරිමය්; මරනය ඈත් කිරිමය්.

"දුදන සහ වාසය සැම දුකට මුල් දෝසය
සුදන සහ වාසය - එසේ නොව සැප දෙය් විසේසය"
යන ගී කවියේ අදහස මේ කවියෙන් තහවුරු වේ. හිතයන්ට ලංවීමටත්, අහිතයන්ගෙන් ඈත් වීමත් අප අතින් සිදු වන්නේ ඉබේටමය.

වි. ක. ධර්මබන්ධු

# හෙලබසේ සිව්රඟ ලියමන් විදිය

මා අද ලියන මේ
"ගැදි කැඬි"
පස් පදයේ පටන්
දස දෙලොස් පහලොස්
පදය දක්වා වන
පද එකතුවක් මිස
පැදි වෙසෙසක් නම් නොවේ

සින්දුවක් නැතහොත්
ගීතයක් විදියට
ඇද ලා පැද ලා
ගැයීමට හෝ
පුජාවලිය වැනි පොතක්
කියවන විදියට හෙවත්
ඉතිපිසෝ ගාතාව
කියවන විදියට ම
කියවිය හැකි උවත්
ඇත්තේ හැටියට ම මෙය
පැදි වෙසෙසක් නම් නොවේ

ඌරකු මෙන් පොලොව
බිඳ ලන 'මැමත්' මීයා
ඌරුමීයා වී ඇත
කොස් ගෙඩියක මදය ඇති
දෙල් ගෙඩියක් තරම් වන
එහි හැඩරුව ද පවතින
'එඩිබල' ගෙඩි වෙසෙස
දෙල්කොස් නම ලබා ඇත.

ඒ නියරට අනුව
ගැදි කඬක ලකුනුත්
පැදියක සැකැස්මත් ඇති
මේ ලියමන් වෙසෙස
'පැදි - ගැදි' යනුවෙන් හෝ
'ගැදි - පැදි' යන නමින්
හඳුන්වා ලීමේ
ඇති දෙසක් මට නොපෙනේ

'සාහිත්‍ය ශූරී'
සම්මානයෙන් පුද ලද / ජී.බී. සේනානායක
වියතානන් විසින්
එක්දහස් නවසිය
ස - සාලිස් වන වසරේ
ලියා පල කරන ලද
'පලි ගැනීම' නම් වු
කෙටි කතා සංග්‍රහයේ එන
'නිශ්ශබ්දතාවයෙන්'
ඇරැඹි 'නිදහස් කවිය'
අනුයමින්

ඇතැම් උගතුන් අද
තම මහඟු අදහස්
නිදහස් කවියෙන්
පල කරන බව පෙනේ

මිනිසාට පලවත් වන
මිනිස් වග සනහන
මහඟු නව අදහස්
කවර ම කවර බසකින්
ගැදි පැදි චම්පු යන
කවර අයුරින් හෝ
ලියා එලි දැක්වීම
මුලු මිනිස් වගට ම
කරන සංග්‍රහයකි

මේ තුන් විදිය හැර
'ගැදි - පැදියෙන්' උවත්
තම නවමු අදහස්
සංග්‍රහ කරන්නේ
ජන හිතකාමියෙකි

(මේ ලියමනේ ණ/ළ/ෂ දුරුකර ඇත. ඉංගිරිසි භාෂාවේ 'මැමත්' ඒ විදිදයටමත් 'එඩිබල්' - 'එඩිබල' විදියටත් ලියා ඇත.)

වි.ක. ධර්මබන්ධු

13 පිටෙන්

ඇත්ත වශයෙන්ම මා මේ ආයතනය පවත්වාගෙන යන්නේ ලාභ උපදවන ආයතනයක් ලෙසින් නෙවෙයි. අප දරුවකුගෙන් අය කරන්නේ ඉතා සාධාරණ මුදලක් එය මෙම ආයතනය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් වන ආකාරයටයි සකස් කර තිබෙන්නේ. මෙය නීත්‍යානුකූලව පවත්වාගෙන වන ආයතනයක්. මා සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගත් දක්ෂ ගුරුවරුන් කණ්ඩායමක් මෙහි සේවය කරනවා. මේ ඉතා වෙහෙස මහන්සි වී 6 වසරේ විභාගයට විශේෂ වැඩසටහනක් සකස් කලා. 7, 8 වසර වල පැවැත්වෙන හයි ස්කූල් විභාගය සඳහා පාඨමාලාව දැනට සකස් කරමින් පවතිනවා. සෑම ගුරුවරයකුම වැඩ කරන්නේ සකස් කරන ලද උපදෙස් මාලාවකට අනුවයි. ඒ කියන්නේ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර යනාදිය සැලකිල්ලට ගෙන සෑම වසරක්ම සඳහා පාඨමාලාවන් සකස් කොට තිබෙනවා.

එහෙම නැතිව එදිනෙදාම ගුරුවරයාට සිතෙන දෙයක් උගන්වන්නේ නැහැ.

**මෙම ආයතනය දැනට පවත්වාගෙන යන්නේ කුමන ස්ථානයේ ද ?**

දැනට මෙය මිල්පාක් හි පවත්වා ගෙන යනවා. තව සති කීපයකින් ග්ලෙන්වේවලි හා වෙරබි යන ප්‍රදේශ වල ශාඛා 2ක් විවෘත කරනවාග

**අවසාන වශයෙන් ඔබට මාපියන්ටත් දරුවන-'ටත් දෙන්න තියෙන පණිවුඩය කිව්වොත්,**

දෙන්න තියෙන පණිවුඩය තමයි දරුවා අත්පොත් තැබූ දින සිට උසස් අධ්‍යාපනය අවසන් වන තෙක් ගත කරන කාල පරිච්ජේදය මත තමයි ඔහුගේ හෝ ඇයගේ අනාගතය නැතහොත් මුළු ජීවිතයම පදනම් වන්නේ. මෙම කාල පරිච්ජේදය ඵලදායී ලෙස ගත කරන දරුවා අනාගතයට පියවර තබන්නේ විශාල ආත්ම විශ්වාසයකින් හා අභිමානයකින්. මෙම කාලය ඵල රහිත ලෙස ගත කරන දරුවා සමාජයට බරක් වෙනවා. පළමු කොටම මාපියන් විසින් මේ මූලික හරය අවබෝධ කොටගෙන දරුවාට නිසි මග පෙන්වා නිසි අධ්‍යාපනය ලබා දීමට ඇප කැප විය යුතුය. දරුවා පන්ති ගෙනයාම පමණක් නෙවෙයි දරුවගේ විවේක කාලය ඔහු ගත කරන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් සොයා බැලීම වැදගත්.

අපේ ශ්‍රී ලාංකීය දරුවන් හරිම දක්ෂයි. ඒ දක්ෂතාවන් ඔප මට්ටම් කොට ඔහුට නිසි අධ්‍යාපනයක් ලබා දීමට මට එළඹීමයි ගුරුන්ගේත් දෙගුරුන්ගේත් වගකීම විය යුත්තේ.



සන්නස
මංගල යෝජනා
දැන්වීම්
ප්‍රතිඵලදායකයි

